# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1990/16 - 2016 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2016.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2016 මාර්තු 29 දින අංක 1960/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වනු ලබන්නා වූ නියමයේ උපලේඛනයේ I වන තීරයේ ''වෛද්‍ය විද්‍යා පීඨය'' යන අයිතමයට අනුරූපවන්නා වූ උපලේඛනයේ II වන තීරයේ ''2. නිර්වින්දන වෛද්‍ය අංශය'' යන සටහන වෙනුවට පහත දැක්වෙන සටහන ආදේශ කිරීමෙන් 2007 පෙබරවාරි 02 දින දරන අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''2. නිර්වින්දනවේදී හා සංකටක සත්කාර වෛද්‍යවේදී අංශය''

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 28 වැනි දින.
කොළඹ දී ය.

11 - 533

1A - PG 3193 — 508 (2016/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*